Gamani Corea Foundation
Freda Corea Awards
2024

# ෆ්‍රීඩා කොරෙයා සම්මාන උලෙළ මෙවරත්

ආචාර්ය ගාමණී කොරෙයා මහතාගේ චින්තනයට ගෞරවය දැක්වීමක් ලෙස, එතුමාගේ දිවංගත මැණියන් වන ෆ්‍රීඩා කොරෙයා මැතිනිය අනුස්මරණය කිරීම සඳහා 'ෆ්‍රීඩා කොරෙයා සම්මාන උලෙළ' දෙවැනිවරටත් මෙම වසරේ (2024) පැවැත්වීමට ගාමණී කොරෙයා පදනම තීරණය කළ බව සතුටින් දන්වා සිටිමු .

පසුගිය වසරේ මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයත්, ඊට සම්බන්ධ වූ බොහෝ දෙනකු දැක්වූ උද්‍යෝගයත්, සැලකිල්ලට ගෙන මෙම සමාජ ව්‍යාපෘතිය (සම්මාන උලෙළ) මෙවරත් පැවැත්වීමට තීරණය කරන ලදී.

සමාජ අභියෝගවලට මුහුණ දෙමින්, දිළිඳුකම පරාජය කැර ජීවිතය ජයගත් දිරිය කාන්තාවන් සහ ඔවුන් කණ්ඩායමක් වශයෙන් එක්ව කැර ගෙන යනු ලබන ප්‍රජා මූලික ව්‍යාපෘති වාර්තා මෙම සම්මාන උලෙළේ දී ඇගයීමට ලක් කරයි.

පවුල් සවිබල ගැන්වීම හරහා දරිද්‍රතාව පිටුදැකීම සහ සංවර්ධන ක්‍රියාවලියට මෙම කාන්තාවන් සහභාගි කරවා ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වී තිබේ. එසේම මෙම සම්මාන උලෙළ මඟින් පහළ පාන්තික මට්ටමේ සිට මධ්‍යම පාන්තික මට්ටමේ ආදායම් ලාභී කාන්තාවන් සහ ඔවුන් ගැන ලියන මෙරට සිටින ලේඛක ලේඛිකාවන් ඇගයීමත්, ඔවුන්ට ත්‍යාග ප්‍රදානය පළාත් මට්ටමෙන් සිදු කිරීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණ වෙයි.

සමාජ අභියෝග සහ බාධක ජය ගත් ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ උත්සාහයන් මෙම සම්මාන උලෙළේ දී ප්‍රධාන කාණ්ඩ තුනක් යටතේ ඇගයීමට ලක් කිරීමට ගාමණී කොරෙයා පදනම පහත දැක්වෙන නිර්ණායක සකස් කැර ඇත.

- පවුල්වල සමාජීය තත්ත්වය නංවාලීම

- කුඩා සහ මධ්‍ය ව්‍යාපෘති මඟින් රටේ ආර්ථික සංවර්ධනයට දායක වීම

- දේශීය හා විදේශීය වශයෙන් පිළිගැනීමක් අත්කර ගැනීම

ආදී නිර්ණායකයන් ඊට ඇතුළත් වෙයි.

මෙම ව්‍යාපෘතියේ අවසන් ඉලක්කය වන්නේ පවුල් සවිබල ගැන්වීම හරහා රටේ සංවර්ධන ක්‍රියාවලියට කාන්තා සහභාගිත්වය දායක කැර ගැනීමයි.

**සංකල්ප-**

**ලේඛකයන් සඳහා තරගයක්**

**තේමාව-**

**දිරිය කාන්තාවන්**

**පළමුව** , ෆ්‍රීඩා කොරෙයා සම්මාන උලෙළ සඳහා ඉදිරිපත්වන ලේඛක ලේඛිකාවන් නිවැරදිව පුරවන ලද තම අයැදුම් පත සමඟ තමන් තෝරා ගත් දිරිය කාන්තාව පිළිබඳව (A4 පිටුවක ප්‍රමාණයේ) කතා සාරාංශයක් ලියා අප වෙත එවා ලියාපදිංචි විය යුතුය. ඒ අතරින් තෝරා ගනු ලබන ලේඛක ලේඛිකාවන්ට දෙවැනි වටය සඳහා ආරාධනා කරනු ලබයි.




**දෙවනුව,** දිරිය කාන්තාවක් සිදු කැර ගෙන යනු ලබන ස්වයං රැකියාවක් හෝ කාන්තාවන් කණ්ඩායමක් එක්ව කැරගෙන යනු ලබන ප්‍රජා මූලික සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳව සාරවත් කතා පුවතක් මෙම ලේඛක ලේඛිකාවන් ලියා එවිය යුතුය. එම කතා පුවත පර්යේෂණාත්මකව සහ ක්‍රමෝපායිකව ලියා අප වෙත එවීම වැදගත් වෙයි.

**තෙවනුව,** ඕනෑම ලේඛක ලේඛිකාවකට තමන් ජීවත්වන ප්‍රදේශය හෝ වෙනත් ප්‍රදේශයකින් දිරිය කාන්තාවක් තෝරාගෙන ඇය පිළිඹඳ කතා පුවතක් සිංහල , දෙමළ, ඉංගිරිසි භාෂාවලින් ලිවිය හැකිය.

**සිව්වැනිව,** සෑම ලේඛක ලේඛිකාවක්ම තමන් තෝරා ගනු ලබන දිරිය කාන්තාව හෝ කාන්තා කණ්ඩායම සමඟ පෞද්ගලික සංවාදයක් පවත්වමින් ඇය සහ ඔවුන් මුහුණ දුන්

ගැටලු සහ අභියෝග පිළිබඳවත්, එම අභියෝග ජය ගත් ආකාරය පිළිබඳවත් කතා පුවත ලිවිය යුතුය.

ගාමණී කොරෙයා පදනම, විශේෂයෙන් පත් කරනු ලැබූ ඇගයීමේ කමිටුවක් මඟින් ලකුණු පිරිනැමීම පදනම් කැර ගත් ඇගැයීමේ ක්‍රියාවලියක් මත ජයග්‍රාහී ව්‍යාපෘති වාර්තාවක් සහ කතා පුවත් විනිශ්චය කරනු ලබයි. එසේම ලේඛක ලේඛිකාවන්ට මෙම සම්මාන උලෙළ සඳහා ලියාපදිංචි වීම පිළිබඳ විස්තර ඉදිරි දිනවලදි පුවත් පත් දැන්වීම් මඟින් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා මෙම දිරිය කාන්තාවන්ට මුහුණ පෑමට සිදු වූ ගැටලු පිළිබඳව මෙම ලේඛක ලේඛිකාවන් එක්රැස් කැර ගත් පර්යේෂණ දත්තයන් සහ තොරතුරු අළලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සකස් කිරීමට අපේක්ෂිතය. ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් කාන්තාවන් සහ ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම , ප්‍රවර්ධනය කිරීම , අනාගත ප්‍රතිපත්ති සැකසීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත මෙම දත්තයන් යැවීමට පියවර ගනු ලබන බව දන්වා සිටිමට කැමැත්තෙමු.